සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය 2018

## ගණිතය

06 ශ්‍රේණිය | කාලය පැය 02 යි

නම/ විභාග අංකය:


### I කොටස

- ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකටම ලකුණු 2 බැගින් හිමිවේ.

01. සමන්ගේ උපන් දිනය 2007 මාර්තු හත් වැනි දින වේ. එම දිනය අන්තර් ජාතික සම්මත ක්‍රමයට ලියා දක්වන්න.


02. [2], [7], [3] යන ඉලක්කම් කාඩ්පත් තුනක ලියා ඇත. එම කාඩ්පත් තුනම භාවිතා කර සෑදිය හැකි විශාලම සංඛ්‍යාව ලියන්න. එහි 7 න් නිරූපණය වන අගය ලියන්න.

03. දී ඇති සංඛ්‍යා රේඛාවේ නිරූපණය කර ඇති සංඛ්‍යා ලියන්න.




04. වෘත්තාකාර හැඩයක් ඇඳීම සඳහා භාවිතා කළ හැකි උපකරණ දෙකක් ලියා දක්වන්න.

05. A හා B ලෙස ලකුණු කර ඇති කෝණ, කුමන වර්ගයට අයත් කෝණ දැයි ලියන්න.





A - ........................ B - ........................

06. පහත ප්‍රකාශනවලට ගැලපෙන අගය හිස් කොටුව තුළ ලියන්න.

(i) 67 x 10 = [ ] (ii) 3400 ÷ 100 = [ ]


07. මෙම රූපයේ ඇති වෘත්ත ගණන වන්නේ,



(i) 4 (ii) 5 (iii) 6 (iv) 7 කි.

---

08. සමාන කොටු සහිත මේස රෙද්දක් මත තීන්ත පැල්ලමක් වැටී ඇති ආකාරය මෙම රූපයෙන් දැක්වේ. මෙම මේස රෙද්ද පුරාම ඇතැයි සිතිය හැකි මුළු කොටු ගණන නිමානය කර ලියන්න.




---

09. පාසල අවසන් වී ගෙදර යාමට සූදානම් වන විට වේලාව ප.ව. 1.45 වී තිබුණි. එම වේලාව සම්මත ආකාරයට ලියා දක්වන්න.

To download past papers visit
www.vajirapani.blogspot.com

---

10. රූපයේ දැක්වෙන සංඛ්‍යාවේ කොටුකර ඇති කලාපවලට ගැලපෙන නම හිස් තැනෙහි ලියන්න.




---

11. 6 ශ්‍රේණියෙහි සිටින සිසුන් ගණන 37 කි. එක සිසුවෙකුට බිස්කට් 5 බැගින් බෙදා දීමට අවශ්‍ය අවම බිස්කට් ප්‍රමාණය සොයන්න.

---

12. පහත එක් එක් කොටුවේ හිස්තැන තුළ ගැලපෙන සංඛ්‍යා ලියන්න.

පැය 1 = මිනිත්තු [ .................... ] = තත්පර [ .................... ]


---

13. වෙළඳසැලකින් රු. 375 ක් වටිනා බඩු මිලට ගෙන වෙළෙන්දාට රු. 1000 ක් දුන් විට ඔබට ලැබෙන ඉතිරි මුදල කොපමණද?


14. සංඛ්‍යා රේඛාවක තිබිය යුතු විශේෂ ලක්ෂණ දෙකක් ලියා දක්වන්න.

To download past papers visit
www.vajirapani.blogspot.com

15. රූපවාහිනී කාටූන් වැඩසටහනක් ආරම්භ කරන ලද්දේ 16 : 30 ටය. එම වේලාව පහත ඔරලෝසු මුහුණතේ ඇඳ දක්වන්න.




16. පහත රූප සටහනේ දැක්වෙන පරිදි විජය නිවාසයේ සිට බැලූ විට ගැමුණු නිවාසය පෙනෙන දිශාව කුමක් ද?




17. සුදුසු පිළිතුර තෝරා කඩ ඉර මත ලියන්න.

i. ගෙබිම ................................ (තිරස් / සිරස්) තලයකි.


ii. නිවසේ සවිකර ඇති දොර පියන ................................ (තිරස් / සිරස්) තලයකි.

18. විදුහලක 5 ශ්‍රේණියේ සිට 6 ශ්‍රේණියට පැමිණි සිසුන් ගණන ආසන්න 10 ට වැටයුම කළ විට 30 ක් විය. තවත් එක් සිසුවෙක් අළුතින් 6 ශ්‍රේණියට ඇතුලත් වීමෙන් පසු සිටින සිසුන් ගණන ආසන්න 10 ට වැටයුම කළ විට 40 කි. දැන් පන්තියේ සිටින සිසුන් ගණන කීයද?

19. නිවැරදි පිළිතුරු ලැබෙන පරිදි හිස්තැන් සම්පූර්ණ කරන්න.


(i) 275 x 0 = [ ............ ]    (ii) 463 x [ ............ ] = 463

20. එක් සංඛ්‍යාවක් එක් වරක් පමණක් යොදා ගනිමින්, සෑම පේළියකම එකතුව 11 වන පරිදි 1 සිට 6 තෙක් සංඛ්‍යා යොදමින් හිස්තැන් පුරවන්න.



- පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් හා අනෙකුත් ප්‍රශ්න සඳහා ලකුණු 11 බැගින් හිමිවේ.


01. (a) කෝණ පාඩමේදී ඔබ ඉගෙන ගත් කෝණ වර්ග පිළිබඳ දැනුම භාවිතයෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



(i) රූපයේ වැඩියෙන්ම දක්නට ලැබෙන කෝණ වර්ගය කුමක් ද?

(ii) එම කෝණ වර්ගය පන්ති කාමරය තුළ දක්නට ලැබෙන අවස්ථා 02 ක් සඳහා නිදසුන් දක්වන්න.

(b) දී ඇති රූපය පිළිතුරු පත්‍රයේ පිටපත් කර ඊතල මඟින් පෙන්වා ඇති කොටස්වලට අදාල නම් ලියා හිස්තැන් සම්පූර්ණ කරන්න.




(c) පහත සඳහන් වචන අතරින් සුදුසු වචන භාවිතා කරමින් හිස්තැන් සම්පූර්ණ කරන්න.
(පරාවර්තන / මහා / සුළු / දෙගුණයක්)

(i) කෝණයක විශාලත්වය සෘජුකෝණයට වඩා කුඩා වේ නම් එම කෝණය ........................ කෝණයක් ලෙස හැඳින්වේ. සෘජු කෝණයක විශාලත්වය මෙන් ........................ විශාලත්වයක් ඇති කෝණයක්, සරල කෝණයක් ලෙස හැඳින්වෙන අතර සරල කෝණයක විශාලත්වයට වඩා කුඩා, නමුත් සෘජු කෝණයක විශාලත්වයට වඩා විශාල කෝණයක් ........................ කෝණයක් ලෙස හැඳින්වේ. සරල කෝණයට වඩා විශාල වන කෝණයක් ........................ කෝණයක් වේ.

(ii) දී ඇති රූපයේ ඉංග්‍රීසි අක්ෂර මඟින් දක්වා ඇති එක් එක් කෝණය විශාලත්වය අනුව කුමන වර්ගයේ කෝණයක් දැයි සඳහන් කරන්න.

To download past papers visit
www.vajirapani.blogspot.com

a →    b →
c →    d →
e →




(iii) මෙම රූපය පිළිතුරු පත්‍රයේ පිටපත් කරගෙන එහි දක්නට ලැබෙන වෙනත් මහා කෝණයක් **f** ලෙස ලකුණු කරන්න.

02. (i) පහත දැක්වෙන සංඛ්‍යා, සංඛ්‍යා රේඛාවක් මත නිරූපණය කරන්න.

A = 3    B = -2    C = 5    D = -4

(ii) -3 ත් 2 ත් අතර ඇති නිඛිල සියල්ලම ලියා දක්වන්න.

(ii) ">" , "<" හෝ "=" යන සංකේත භාවිත කර හිස්තැන් සම්පූර්ණ කරන්න.

a  -3 ............... +1    b  2 ............... -1
c  +3 ............... 3    d  0 ............... 4
e  5 ............... 0

03. (a) 564 327 යන සංඛ්‍යාවේ,

(i) සංඛ්‍යා නාමය ලියන්න.    (ii) 2 ඉලක්කම පිහිටන ස්ථානයේ නම කුමක් ද?

(iii) 3 ඉලක්කමේ ස්ථානීය අගය කුමක් ද?    (iv) 4 ඉලක්කමේ නිරූපණය වන අගය කුමක් ද?

(b) හත් බිලියන හයසිය විසි අට මිලියන තිස් හතර දහස් අට යන නාමයට අදාල සංඛ්‍යාව ලියන්න.

04. (a) පැකට්ටුවක ටොෆි 150 ක් ඇත. එවැනි ටොෆි පැකට් 5 ක මිල රු. 1500 ක් වේ.

(i) ටොෆි පැකට් එකක මිල සොයන්න.

(ii) එක් ටොෆියක මිල සොයන්න.

(iii) සිසුන් 825 කට ටොෆි 2 බැගින් බෙදා දීමට,

(අ) අවශ්‍ය ටොෆි පැකට් ගණන සොයන්න.    (ආ) ඒ සඳහා වැයවන මුදල සොයන්න.

(b) (i) 37 x 28 අගය සොයන්න.    (ii) 856 ÷ 12 ලබ්ධිය හා ශේෂය සොයන්න.


05. ශිෂ්‍යයකු විසින් වෘත්තයක් සමාන කොටස් දෙකක් ලැබෙන සේ නැවීමෙන් ලබා ගත් AB හා CD නැමුම් රේඛා හමුවන ලක්ෂය O ලෙස නම් කර ඇත.

(i) වෘත්තයේ හරි මැද පිහිටි ලක්ෂය හැඳින්වීමට ලියා ඇති අක්ෂරය නම් කරන්න.

(ii) වෘත්තයේ හරි මැද ලක්ෂ්‍යයේ සිට A, B, C හා D යන ලක්ෂ වලට ඇති දුර පිළිබඳව කුමක් කිව හැකි ද?

(iii) වෘත්තය ඇතුලත ඇති ලක්ෂය 2 ක් ලියා දක්වන්න.

(iv) ඔබ කැමති වෘත්ත රටාවක් ඇද දක්වන්න.




---

06. (a) පාපැදි ධාවන තරගයක් පෙ.ව. 08.30 ආරම්භ වී ප.ව. 01.15 ට අවසන් විය.

(i) පාපැදි ධාවන තරගය ආරම්භ වූ වේලාව සහ අවසන් වූ වේලාව සම්මත ක්‍රමයට දක්වන්න.

(ii) පාපැදි ධාවන තරගය පැවැත්වූ කාලය පැය හා මිනිත්තු වලින් සොයන්න.

(iii) ධාවන තරගය පැවැත්වූ මුළු කාලය මිනිත්තුවලින් දක්වන්න.

To download past papers visit
www.vajirapani.blogspot.com

(b) සුළු කරන්න.

(i)

| | මිනිත්තු | තත්පර |
|---|---|---|
| | 12 | 15 |
| + | 6 | 46 |
| | | |

(ii)

| | දින | පැය |
|---|---|---|
| | 14 | 12 |
| + | 8 | 19 |
| | | |

---


07. එක්තරා පාසල් භූමියක ස්ථාන කිහිපයක පිහිටීම නිරූපණය වන දළ සටහනක් පහත දක්වා ඇත.

(i) ක්‍රීඩා පිටියට නිරිත දිශාවෙන් හා මුර කුටියට ඊසාන දිශාවෙන් විද්‍යාගාරය පිහිටා ඇත. කාර්යාලයේ සිටි විදුහල්පති තුමා විද්‍යාගාරයට ගොස් ගිණිකොණ දිශාව බැලූ විට අඹ ගස දිස් විය. ඉහත තොරතුරු ඇසුරින් හිස් තැන් සඳහා ගැලපෙන නිවැරදි පිහිටුම් ලියා දක්වන්න.

(ii) ඉහත සටහනෙහි දක්වෙන පිහිටීම් ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(a) පුස්තකාලය පිහිටා ඇත්තේ පාසල් ගේට්ටුවට කුමන දිශාවෙන් ද?

(b) පාසල් ගේට්ටුව පිහිටා ඇත්තේ විද්‍යාගාරයට කුමන දිශාවෙන් ද?






(c) විද්‍යාගාරයට වයඹ දිශාවෙන් පිහිටා ඇත්තේ කුමක් ද?



(iii) සත්සර පාසල් භූමියේ පිහිටි ආපන ශාලාවේ සිට 6m ක් උතුරු දිශාවට ගොස් එතැන් සිට 2m ක් බටහිර දිශාවට ගමන් කර තම පන්ති කාමරයට පැමිණේ. සත්සර ගමන් කල මාර්ගය දළ රූප සටහනක දක්වන්න.

## පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | |
|---|---|---|---|
| 01. | 2007 - 03 - 07 | | 02 |
| 02. | 732 | 01 | |
| | 700 | 01 | 02 |
| 03. | -3, -1, 5 දෙකකට | 01 | |
| | සියල්ලටම | | 02 |
| 04. | රු. 2 කාසිය, | 01 | |
| | බෝතල් මූඩිය | 01 | 02 |
| | වැනි නිවැරදි පිළිතුරු දෙකකට | | |
| 05. | A - සෘජු කෝණය | 01 | |
| | B - මහා කෝණය | 01 | 02 |
| 06. | (i) 670 | 01 | |
| | (ii) 34 | 01 | 02 |
| 07. | 7 | | 02 |
| 08. | 6 x 4 = 24 | | 02 |
| 09. | 13 : 45 | | 02 |
| 10. | ඒකක | 01 | |
| | මිලියන | 01 | 02 |
| 11. | 37 x 5 | 01 | - |
| | 185 | | 02 |
| 12. | 60 | 01 | - |
| | 3600 | 01 | 02 |
| 13. | 1000 - 375 | 01 | - |
| | රු. 625 | | 02 |
| 14. | දකුණු කෙළවර ඊ හිසක් තිබීම | 01 | |
| | සමාන පරතරයකින් සංඛ්‍යා තිබීම | 01 | |
| | වැනි නිවැරදි පිළිතුරු දෙකකට | | 02 |
| 15. |  | | 02 |
| 16. | ඊසාන | | 02 |
| 17. | තිරස් | 01 | |
| | සිරස් | 01 | 02 |
| 18. | 35 | | 02 |
| 19. | 0 | 01 | |
| | 1 | 01 | 02 |
| 20. |  | | 02 |
| | | | 40 |

### II කොටස



| | | | |
|---|---|---|---|
| 01. | (a) (i) සෘජු කෝණ | 02 | |
| | (ii) නිවැරදි පිළිතුරු 2 ක් සඳහා | 02 | |
| | (b)   | 02 | |
| | (c) (i) සුළු කෝණයක්, දෙගුණයක්, මහා කෝණයක්, පරාවර්ත | 04 | |
| | (ii) a → සෘජු කෝණයක්<br>b → පරාවර්ත කෝණයක්<br>c → මහා කෝණයක්<br>d → සුළු කෝණයක්<br>e → මහා කෝණයක් | 05 | |
| | (iii) මහා කෝණයක් f ලෙස ලකුණු කිරීමට | 01 | |
| | | | 16 |
| 02. | (i)   | 04 | |
| | (ii) -2 , -1 , 0 , 1 | 02 | |
| | (iii) a) -3 < +1<br>b) 2 > -1<br>c) +3 = 3<br>d) 0 > -4<br>e) 5 > 0 | 05 | |
| | | | 11 |
| 03. | (a) (i) පන්සිය හැටහතර දහස් තුන්සිය විසි හත | 02 | |
| | (ii) දසස්ථානය | 02 | |
| | (iii) 100 | 02 | |
| | (iv) 4000 | 02 | |
| | (b) 7 628 034 008 | 03 | |
| | | | 11 |

To download past papers visit www.vajirapani.blogspot.com

පිළිතුරු පත්‍රය

| | | | |
|---|---|---|---|
| 04. | (a) (i) රු. 1500 ÷ 5 | 01 | |
| | = රු. 300 | 01 | |
| | (ii) රු. 300 ÷ 150 | | |
| | = රු. 2 | 01 | |
| | (iii) (අ) 1650 ÷ 150 | 01 | |
| | 11 | 01 | |
| | (ආ) රු. 300 x 11 | 01 | |
| | = රු. 3300 | 01 | |
| | (b) (i) 37 x 28 = 1036 | 02 | |
| | (ii) 856 ÷ 12 | | |
| | ලබ්ධිය = 71 | 01 | |
| | ශේෂය = 4 | 01 | |
| | | | 11 |
| 05. | (i) O | 02 | |
| | (ii) සමාන වේ. | 02 | |
| | (iii) P , Q | 02 | |
| | (iv) නිවැරදි රූපයකට | 05 | |
| | | | 11 |
| 06. | (a) (i) ආරම්භ වූ වේලාව = 08 : 30 | 01 | |
| | අවසන් වූ වේලාව = 13 : 15 | 01 | |
| | (ii) 13 : 15 − 08 : 30 = 4 : 45 | 02 | |
| | පැය 4 මිනිත්තු 45 | 01 | |
| | (iii) පැ. 4 මි. 45 = පැ. 4 + මි. 45 | | |
| | = මි. 240 + මි. 45 | | |
| | = මිනිත්තු 285 | 02 | |
| | (b) (i) මිනිත්තු 12 තත්පර 15 + මිනිත්තු 6 තත්පර 46 = මිනිත්තු 19 තත්පර 01 | 02 | |
| | (ii) දින 14 පැය 12 + දින 8 පැය 19 = දින 23 පැය 07 | 02 | |
| | | | 11 |

To download past papers visit
www.vajirapani.blogspot.com

| | | | |
|---|---|---|---|
| 07. | (i)  | 03 | |
| | (a) නැගෙනහිර | 02 | |
| | (b) බටහිර | 02 | |
| | (c) ගැමුණු ශාලාව | 02 | |
| | (ii)  | 02 | |
| | | | 11 |